Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති ගිනිභට, පුස්තකාල සහායක, රියැදුරු, කාර්යාල කාර්ය සහායක, මුරකරු, සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2019-08-19 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01 | ගිනිභට | 02 | - | RS1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 29,540/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 02 | පුස්තකාල සහායක | 01 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 03 | රියැදුරු | 04 | III | PL3-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 25,790 - 10x270 - 10x300 - 10x330 -12x350 - රු. 38,990 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 25,790, 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 04 | කාර්යාල කාර්ය සහායක | 01 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410/= වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 05 | මුරකරු | 01 | III | |
| 06 | සෞඛ්‍ය කම්කරු | 04 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250, 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 07 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | III | |

01. ගිනිභට තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ගණය :- නියාමන සේවා

අධ්‍යාපන සුදුසුකම් :- එකවරකදී සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් ද සමත්ව තිබිය යුතුය.

කායික සුදුසුකම් :-

i. උස සෙ.මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය.)

ii. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතරද, වර්ණ පෙනීමද සාමාන්‍ය විය යුතුය.

iv. කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා- පච්ච කොටා තිබීම වැනි)

වෙනත් සුදුසුකම් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුයි.

iii. අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

iv. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කල යුතුය.

v. තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

වයසඃ-

| | | |
|---|---|---|
| අවම සීමාව | - | අවුරුදු 18 ට නොඅඩු |
| උපරිම සීමාව | - | අවුරුදු 24 ට නොවැඩි |

බඳවා ගැනීමේ ක්‍රමය :-

i. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිහටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

ii. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිහටයින් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

iii. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිහට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාලසීමාව තුළදී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිහටයින් කිසිම වන්දියක් නොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

iv. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිහටයින් ගිනිහට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

v. පුහුණු කාලසීමාව තුළ මාසිකව රු.10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

vi. පුහුණු කාලසීමාව තුළදී කිසිම ආධුනික ගිනිහටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

vii. පුහුණුවට තෝරා ගන්නා ලද ආධුනික ගිනිහටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු.500,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

viii. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

ix. ගිනිහට තනතුර සඳහා පත්වීම ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

ලිඛිත විභාගය :

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය<br>(ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.) | පැය 01 | 100 | 40 |

*වෘත්තීය පරීක්ෂණය* :

ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)

මෙම පරීක්ෂණයට සහභාගී වීමේදී ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතික-යක් ඉදිරිපත් කළ යුතුවේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| දරා ගැනීමේ හැකියාව<br>i. දිවීම (කිලෝ මීටර් 01 ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>ii. ඩිප්ස් ගැසීම (නිවැරදිව ඩිප්ස් 25 ක් ගැසීමට ගතවන අවම කාලය)<br>iii. බර ඔසවාගෙන යෑම | 60 | 36 |
| සමබරතාවය<br>i. ඉනිමගේ යෑම<br>ii. කඹයෙන් බැසීම | 40 | 24 |

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:*

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

*රැකියා විස්තරය:*

i. ගිනි නිවීම් සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම් හා පුහුණු කිරීම්.
ii. ගිලන් රථ සේවා, තාක්ෂණික සේවා, සන්නිවේදන රාජකාරී, ප්‍රභූ ආරක්ෂක සේවා සහ ගිනි නිවාරණ පොරොත්තු රාජකාරී.
iii. හදිසි ආපදා, හදිසි මුදා ගැනීම් සහ විවිධ මානුෂීය අවශ්‍යතාවන් සඳහා වන මෙහෙයුම්.
iv. ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන සියලුම කාර්යයන්.
v. සේවාවේ ඉහල නිලධාරීන් විසින් පවරනු ලබන රාජකාරී කටයුතු යටතට ගැනෙන සියලුම රාජකාරී.
vi. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝග වලට අනුව තම කාර්යයන් ඉටු කිරීම.
vii. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම.

02. පුස්තකාල සහායක තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-

*සේවා ගණය:-* ප්‍රාථමික ශිල්පීය නොවන

*අධ්‍යාපන සුදුසුකම්:-* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

*සටහන.-* බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන්ගෙන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

*කායික සුදුසුකම්:-* සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය:- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>■ සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>■ සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>■ අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>■ විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

*සටහන:-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටුකර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීමද මෙහිදී සිදු කෙරේ.

වයස:-

අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

රැකියා විස්තරය :- පුස්තකාලය ප්‍රසන්නව, සිත් ඇද ගන්නාසුළු අයුරින් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම, පුවත්පත් සඟරා නියමිත ස්ථානවල තැන්පත් කිරීම, පාඨකයින් විසින් භාරදෙනු ලබන පොත් භාර ගැනීම හා ඒවා නියමිත ස්ථානයේ තැන්පත් කිරීම, පුස්තකාලයාධිපතිට අවශ්‍ය අවස්ථා වලදී සහාය ලබා දීම.

03. රියැදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ගණය:- ප්‍රාථමික ශිල්පීය

අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරකදී විෂයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුයි)
*සටහන .-* කසල ප්‍රවාහනය කරන වාහන වල රියැදුරු තනතුරු සඳහා පමණක් 8 ශ්‍රේණිය සමත් වීම සලකා බලනු ලැබේ.

වෘත්තීය සුදුසුකම් :

1. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුයි)
2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුයි.

සංලක්ෂය.- ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථා වලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ ' ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

පළපුරුද්ද: බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.)

කායික සුදුසුකම්: අවම උස අඩි පහක් (5') විය යුතුය.

දිවාකාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුයි. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය: වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් සමත් වන අයදුම්කරුවන් පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

ඉහත වෘත්තීය පරීක්ෂණය පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන විධායක / මාණ්ඩලික නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලැබේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම් සඳහා පැවැත්වේ. ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

වයස:-

අවම සීමාව - අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*සටහන* - දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

04. 05. කාර්යාල කාර්ය සහායක හා මුරකරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ශ්‍රේණිය:- ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

*සටහන* :- බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන්ගෙන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

කායික සුදුසුකම්:- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය:-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>■ සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>■ සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>■ අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>■ විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

*සටහන* :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

වයස:-

අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

රැකියා විස්තරය:- ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා ඒවා නිසියාකාරව පවත්වාගෙන යාම සහ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

06. 07. සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්:-

සේවා ශ්‍රේණිය:- ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම්:- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

කායික සුදුසුකම්:- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

සටහන:- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.

වයස:-

අවම සීමාව - අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සියලුම තනතුරුවලට අදාළ වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කළ යුතුය.
III. යහපත් චරිතයකින් යුක්ත වීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත ය.

භාෂා ප්‍රවීණතාවය :-

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච. 01/2014 චක්‍රලේඛයේ හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ. |

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝග වලටද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝග වලටද අනුව කටයුතු කළ යුතුය.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

නාගරික කොමසාරිස් (රා.ඉ.),
මහා නගර සභාව,
මීගමුව.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**තනතුරු සඳහා අයදුම් පත්‍රය**

මීගමුව මහා නගර සභාව

ඉල්ලුම් කරන තනතුර - ...............................................................................................................................

1. මුලකුරු සමග නම :- ..........................................................................................................
2. සම්පූර්ණ නම :- ..........................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................................................
4. ස්ථිර පදිංචි ලිපිනය :- ..........................................................................................................
5. දුරකථන අංකය :- ..........................................................................................................
6. තැපැල් ලිපිනය :- ..........................................................................................................
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................................................................................
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..................................................................................
9. ස්ථිර පදිංචිය දරණ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :- ...............................................................
10. උපන් දිනය :- ..........................................................................................................
11. 2019-08-19 දිනට වයස :- ..........................................................................................................
12. අධ්‍යාපන සුදුසුකම් :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
13. පළපුරුද්ද :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
14. වෘත්තීය සුදුසුකම් :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
15. වෙනත් සුදුසුකම් :-..........................................................................................................
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග :-.......................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත් වන බව හොඳාකාරවම දනිමි.

................................................
අයදුම්කරුගේ අත්සන

දිනය :- ......................................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................................................................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .................................................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු / ඇය තෝරා පත්වුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කල හැකිය / නොහැකිය. ඔහු / ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.....................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :-..........................................................................
තනතුර :-......................................................................

දිනය :-..........................................................................